සියලුම හිමිකම් ඇවිරිණි/முழுப் பதிப்புரிமையுடையது/All Rights Reserved

දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
தென் மாகாணக் கல்வித் திணைக்களம்
Department of Education, Southern Province

අවසාන වාර පරීක්ෂණය - 2023 (2024)
ஆண்டிறுதிப் பரீட்சை - 2023 (2024)/ Final Term Test - 2023 (2024)

№ 001706

ශ්‍රේණිය / தரம் / Grade: 9 ශ්‍රේණිය

ඉතිහාසය I - II

කාලය / நேரம் / Time: පැය 2 යි

නම / பெயர் / Name ..............................

විභාග අංකය / சுட்டிலக்கம் / Index No. ..............................

සැලකිය යුතුයි :

- ❖ ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සපයන්න

---

1 කොටස

- අංක **01** සිට **20** තෙක් ප්‍රශ්නවලට නිවැරදි පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.

1. මෙරටට පැමිණි පළමු ලන්දේසි ජාතිකයා කවුරුන් ද?
   1. සිබෙල් ද වර්ට් 2. ජෙරාඩ් හල්ෆ්ට් 3. ජොරිස් වැන් ස්පිල් බර්ජන් 4. කලන් අල්බස්

2. ලන්දේසීන්ගේ පෙරදිග මූලස්ථානය ලෙස යොදා ගනු ලැබුවේ කුමන ස්ථානය ද?.
   1. ගෝව 2. මදුරාසිය 3. පොන්ඩිචෙරි 4. බතාවිය

3. ලංකාවේ අවසාන සිංහල රජතුමා වන්නේ,
   1. ශ්‍රී වීර පරාක්‍රම නරේන්ද්‍රසිංහ රජු ය 3. ශ්‍රී වික්‍රම රාජසිංහ රජු ය 3. රාජාධි රාජසිංහ රජු ය 4. පළවන විමලධර්මසූරිය රජු ය

4. අභ්‍යන්තර භාණ්ඩ ප්‍රවාහනය සඳහා ලන්දේසීන් විසින් මෙරට ඉදි කළ ඇළ මාර්ගය කුමක්ද?
   1. තල්දෙන ඇළ 2. හාල්පාන් ඇළ 3. රිදී බැඳි ඇළ 4. හැමිල්ටන් ඇළ

5. මෙරට වාරි මාර්ග දෙපාර්තමේන්තුව ආරම්භ කිරීම ට කටයුතු කළ බ්‍රිතාන්‍ය ආණ්ඩුකාරවරයා වන්නේ,
   1. හෙන්රි වෝඩ් ය 2. හර්කියුලීස් රොබින්සන් ය 3. විලියම් ග්‍රෙගරි ය 4. වෙස්ට් රිජ්වේ ය

6. බ්‍රිතාන්‍ය පාලන සමයේ මෙරට වගා කරන ලද මුල්ම වතු භෝගය කුමක්ද?
   1. තේ 2. කෝපි 3. කොකෝවා 4. පොල්

7. ඉංග්‍රීසි පෙරදිග වෙළඳ සමාගම යටතේ මෙරට මුහුදුබඩ ප්‍රදේශ පාලනය කිරීම හැඳින්වූයේ,
   1. කිරීටයේ පාලනය යනුවෙනි 2. වෙළඳ සමාගමේ පාලනය යනුවෙනි 3. මදුරාසි පාලනය යනුවෙනි 4. VOC පාලනය යනුවෙනි

8. මෙරට සමාජය ට බර්ගර් (ලංසි) ජනතාව එකතු වූයේ කුමන යුරෝපා ජාතිකයන්ගෙන් ද?
   1. ලන්දේසි 2. පෘතුගීසි 3. ප්‍රංශ 4. ඉංග්‍රීසි

9. දෙවන නිදහස් සටන ආරම්භ වූයේ කුමන ප්‍රදේශයකින් ද?
   1. වෙල්ලස්ස 2. දුම්බර 3. මහනුවර 4. මාතලේ

10. මාලිගාකන්දේ විද්‍යෝදය පිරිවෙන ආරම්භ කිරීමේ පුරෝගාමියා වන්නේ,
    1. වලානේ සිද්ධාර්ථ හිමි. 2. හික්කඩුවේ සුමංගල හිමි 3. රත්මලානේ ශ්‍රී ධර්මාලෝක හිමි. 4. මිගෙට්ටුවත්තේ ගුණානන්ද හිමි

11. "අ " තීරුව "ආ" තීරුව හා ගලපා නිවැරදි පිළිතුර තෝරන්න.

| අ තීරුව | ආ තීරුව |
|---|---|
| 1. උදයභානු පුවත්පත ආරම්භ කිරීම | A. අනගාරික ධර්මපාල තුමා |
| 2. සිංහල බෞද්ධයා පුවත්පත් ආරම්භ කිරීම | B. හෙන්රි ස්ටීල් ඕල්කට් තුමා |
| 3. මද්රාසා පාසල් ආරම්භ කිරීම | C. ආරුමුග නාවලර් තුමා |
| 4. බෞද්ධ කොඩිය නිර්මාණය කිරීම | D. සිද්දි ලෙබ්බෙ තුමා |

1. C A B D  2. D A C B  3. C A D B  4. D B C A

12. ඉන්දියාවේ **"සම්භාවනීය මහල්ලා"** යන අන්වර්ථ නාමයෙන් ප්‍රකට වූයේ,

1. සුරේන්ද්‍රනාත් බැනර්ජි ය
2. මහත්මා ගාන්ධි ය
3. දඩාබායි නඖරෝජි ය
4. බාල් ගංගාධාර් තිලක් ය

13. ඉන්දියානු ප්‍රදේශ වල නීත්‍යානුකූල රජ පරපුරක ට අයත් උරුමකරුවෙකු නොමැති ව පාලකයා මිය ගිය විට එම රාජ්‍යයන් වෙළඳ සමාගමට අයත් වූයේ,

1. රෝලට් පනත අනුව ය.
2. අස්වාමික න්‍යාය අනුව ය.
3. උපකාරක ගිවිසුම් ක්‍රමය අනුව ය.
4. සීමන් කොමිසම් වාර්තාව අනුව ය.

14. සිපොයි කැරැල්ල ආරම්භ වීමට බලපෑ ආසන්නතම හේතුව කුමක් ද?

1. වෙළඳ සමාගමේ ආර්ථික ප්‍රතිපත්තිය නිසා දේශීය කර්මාන්ත බිඳවැටීම.
2. ක්‍රිස්තියානි ආගම පැතිරවීම ට ඉංග්‍රීසීන්ගේ සහාය ලබාදීම.
3. ඉන්දියානු ප්‍රදේශ අල්ලා ගැනීමේ දී ඉංග්‍රීසීන් අනුගමනය කළ ප්‍රතිපත්තිය.
4. එන්ෆීල්ඩ් නම් රයිෆල් භාවිතය ප්‍රතික්ෂේප කිරීම නිසා ඉන්දිය හමුදා භටයින් ට දඬුවම් පැමිණවීම.

15. ව්‍යවස්ථාදායක සභාව ට ප්‍රථමයෙන් පත්වූ උගත් ලාංකිකයා වන්නේ,

1. පොන්නම්බලම් අරුණාචලම් මහතා ය.
2. පොන්නම්බලම් රාමනාදන් මහතා ය.
3. ජේම්ස් පීරිස් මහතා ය.
4. ඩී.එස්.සේනානායක මහතා ය.

16. ව්‍යවස්ථාදායක සභාවේ නිල ලත් පිරිස ට වඩා නිල නොලත් පිරිස මුල් වරට බහුතරය බවට පත්වූයේ කුමන ආණ්ඩුක්‍රම ප්‍රතිසංස්කරණයකින් ද?

1. කෝල්බෲක්-කැමරන් ආණ්ඩු ක්‍රමය.
2. ඩොනමෝර් ආණ්ඩු ක්‍රමය.
3. මැනිං-ඩෙවොන්ෂයර් ආණ්ඩු ක්‍රමය.
4. මැනිං ආණ්ඩු ක්‍රමය.

17. වාර්ගික නියෝජන ක්‍රමය අහෝසි කිරීම සිදු කරන ලද්දේ කුමන ආණ්ඩුක්‍රම ප්‍රතිසංස්කරණයක් මගින් ද?

1. සෝල්බරි  2. මැනිං  3. ඩොනමෝර්  4. මැනිං-ඩෙවොන්ෂයර්

18. පළමු ජනරජ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට අනුව නීති සම්පාදනය කළ ආයතනය හැඳින්වූයේ කුමන නමකින් ද?

1. ජාතික රාජ්‍ය සභාව  2. රාජ්‍ය මන්ත්‍රණ සභාව  3. පාර්ලිමේන්තුව  4. ව්‍යවස්ථාදායක සභාව

19. මෙරට ආරම්භ කරන ලද ප්‍රථම බහු කාර්යය සංවර්ධන යෝජනා ක්‍රමය වන්නේ,

1. මහවැලි සංවර්ධන යෝජනා ක්‍රමය යි
2. හුරුළු ඔය යෝජනා ක්‍රමය යි
3. ගල්ඔය සංවර්ධන යෝජනා ක්‍රමය යි
4. උඩවලව සංවර්ධන යෝජනා ක්‍රමය යි

20. වර්තමාන ශ්‍රී ලංකාවේ ඉහළම හා අවසාන අභියාචනාධිකරණ බලය හිමි ආයතනය කුමක් ද?

1. දිසා අධිකරණය  2. අභියාචනාධිකරණය  3. මහාධිකරණය  4. ශ්‍රේෂ්ඨාධිකරණය

(2 × 20 =40)

## II කොටස

- පළමු ප්‍රශ්නයට හා තවත් ප්‍රශ්න හතරකට **පිළිතුරු සපයන්න**

01) (අ) පහත දැක්වෙන ලංකා සිතියමේ දක්වා ඇති අක්ෂර වලට අදාලව නම පහත දක්වා ඇති ලැයිස්තුවෙන් තෝරා ඔබේ පිළිතුරු පත්‍රයේ ලියන්න.

i. මඩකලපුව
ii. ගාල්ල
iii. මන්නාරම
iv. වළවේ ගඟ
v. මහනුවර
vi. කල්පිටිය




(ලකුණු 06)

(ආ)



A රූපය

(i) A රූපයෙන් දැක්වෙන පුද්ගලයා නම් කරන්න.

(ii) මොහු විසින් ආරම්භ කරන ලද දේශපාලන පක්ෂය කුමක් ද?

(iii) මොහු විසින් ආරම්භ කරන ලද බහු කාර්යය සංවර්ධන යෝජනා ක්‍රමය කුමක්ද?

(ලකුණු 03)

(ඇ)



B රූපය

(i) B රූපයෙන් දැක්වෙන පුද්ගලයා කවුරුන් ද?

(ii) ඔහු කුමන ආගමක් හා සම්බන්ධ පුද්ගලයෙක් ද?

(iii) මොහු විසින් රචනා කල පෙළපොත කුමක් ද?.

(ලකුණු 03)

(02) (i) ලන්දේසීන් විසින් මෙරට මුහුදු බඩ ප්‍රදේශ අල්ලා ගැනීමෙන් පසු පාලන පහසුව සඳහා ඒවා බෙදා තිබූ ප්‍රධාන කොටස් තුන ලියන්න (ලකුණු 03)

(ii) ලන්දේසීන් මෙරටින් ගෙන ගිය වෙළෙඳ ද්‍රව්‍ය හතරක් නම් කරන්න. (ලකුණු 04)

(iii) ලන්දේසි පාලනය නිසා මෙරට සිදුවූ සමාජ හා සංස්කෘතික බලපෑම් දෙකක් කෙටියෙන් පැහැදිලි කරන්න (ලකුණු 05)

(03) (i) ක්‍රි:ව 1797 මෙරට මුහුදු බඩ ප්‍රදේශ වල හටගත් කැරැල්ල ට හේතු වූ බදු වර්ග තුනක් නම් කරන්න. (ලකුණු 03)

(ii) A - ක්‍රි:ව: 1818 ප්‍රථම නිදහස් සටන ව්‍යාප්ත වූ ප්‍රදේශ දෙකක් නම් කරන්න. (ලකුණු 02)

B - ක්‍රි:ව: 1848 දෙවන නිදහස් සටනට බලපෑ ආසන්නතම හේතුව කුමක් ද? (ලකුණු 02)

(iii) දෙවන නිදහස් සටනේ ප්‍රතිඵල දෙකක් කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 05)

(04) (i) ක්‍රිස්තියානි ආගම ප්‍රචාරය කිරීම සඳහා මිෂනාරීන් යොදා ගත් උපක්‍රම තුනක් සඳහන් කරන්න. (ලකුණු 03)

(ii) පහත සඳහන් සිදුවීම් හා සම්බන්ධ පුද්ගලයින් වරහන් තුළින් තෝරා ලියන්න.

A - ලංකෝපකාර මුද්‍රණාලය පිහිටුවීම.

B - පානදුරාවාදය පැවැත්වීම.

C - සිදත් සඟරා සන්නස රචනා කිරීම.

D - කොළඹ තරුණ බෞද්ධ සංගමය පිහිටුවීම. (ලකුණු) 04)

(අනගාරික ධර්මපාල තුමා, හික්කඩුවේ සුමංගල හිමි, ධම්මාලංකාර සිරි සුමනතිස්ස හිමි, ඩී.බී. ජයතිලක මහතා, මිගෙට්ටුවත්තේ ගුණානන්ද හිමි.)

(iii). A - පොන්නම්බලම් රාමනාදන් මහතා විසින් හින්දු දරුවන්ගේ අධ්‍යාපන පහසුකම් නඟා සිටුවීම සඳහා ඉදි කල පාසල් දෙකක් ලියන්න. (ලකුණු 02)

B - ඉස්ලාම් ආගමික පුනරුදය සඳහා නායකත්වය ගත් පුද්ගලයින් විසින් ඒ සඳහා ගන්නා ලද ක්‍රියා මාර්ග තුනක් ලියන්න (ලකුණු 03)

(05) (i) පහත A,B,C යටතේ දැක්වෙන තොරතුරු වලට අදාල පුද්ගලයන් වරහන් තුලින් තෝරා ලියන්න.

A - ඉන්දියානු ජාතික සංගමයේ ප්‍රථම සභාපතිවරයා

B - ඉන්දියාවේ අවසන් බ්‍රිතාන්‍ය ප්‍රතිරාජයා

C - නිදහස් ඉන්දියාවේ ප්‍රථම අගමැතිවරයා

(මවුන්ට්බැටන් සාමි, ශ්‍රී ජවහල්ලාල් නේරු, මහත්මා ගාන්ධි, ඩබ්.සී. බෙනර්ජි) (ලකුණු 03)

(ii) බ්‍රිතාන්‍ය පාලන සමයේ ඉන්දියානුවන් තුල දේශානුරාගය වර්ධනය වීමට බලපෑ හේතු දෙකක් සඳහන් කරන්න. (ලකුණු04)

(iii) ඉන්දියානු නිදහස් සටනේ දී ඉංග්‍රීසි පාලනයට එරෙහිව ගෙන ගිය අවිහිංසාවාදී සටන් ව්‍යාපාර තුනක් සඳහන් කර ඉන් එකක් කෙටියෙන් විස්තර කරන්න. (ලකුණු 05)

(06) (i) පහත දැක්වෙන සිදුවීම් හා සම්බන්ධ පුද්ගලයින් A, B හා C අනුපිළිවෙලින් සඳහන් කරන්න.

A - නිදහස් අධ්‍යාපනයේ පියා.

B - මෙරට ප්‍රථම බ්‍රිතාන්‍ය අණ්ඩුකාරවරයා.

C - මෙරට ප්‍රථම අගමැතිනිය. (ලකුණු 03)

(ii) බ්‍රිතාන්‍යය ආණ්ඩුක්‍රමයේ වෙනස්කම් ඇතිකර ගැනීම සඳහා උද්ඝෝෂණ වල නිරත වූ යුරෝපීය නායකයන් දෙදෙනෙක් සහ දේශිය නායකයන් දෙදෙනෙක් ලියන්න. (ලකුණු 04)

(iii) 1931 ඩොනමෝර් ආණ්ඩුක්‍රමයේ කැපී පෙනෙන ලක්ෂණ දෙකක් නම් කර ඉන් එකක් විස්තර කරන්න. (ලකුණු 05)

(07) (I) පහත දැක්වෙන සිදුවීම් හා සම්බන්ධ පුද්ගලයින් A, B හා C අනුපිළිවෙලින් සඳහන් කරන්න.

A - ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ නිර්මාතෘවරයා

B - ශ්‍රී ලංකාවේ ප්‍රථම ජනාධිපතිවරයා.

C - 1953 දී ඇතිවූ හර්තාලය නිසා ධූරයෙන් ඉල්ලා අස්වූ අගමැතිවරයා (ලකුණු03)

(ii) 1978 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව අනුව ජනාධිපතිවරයා ට හිමිව ඇති,

A - විධායක බලතල දෙකක්

B - පාර්ලිමේන්තුව සම්බන්ධ බලතල දෙකක් බැගින් සඳහන් කරන්න. (ලකුණු 04)

(iii) නිදහසින් පසු බලයට පත් සෑම රජයක්ම මෙරට අධ්‍යාපනය දියුණුකිරීම සඳහා කටයුතු කර ඇත. ඒ සඳහා අනුගමනය කළ ක්‍රියා මාර්ග තුනක් සඳහන් කර එකක් කෙටියෙන් පැහැදිලි කරන්න (ලකුණු 05)

**දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව**

**9 ශ්‍රේණිය - ඉතිහාසය**

**පිළිතුරු - 1 කොටස**

| | |
|---|---|
| 1).3 ( ජොමිස් වැන් ස්පිල්බර්ජන් ) | 11).3 (C A D B) |
| 2).4 ( බතාවිය) | 12 ). 3 (දඩාබායි නබරෝජි ) |
| 3).1 (ශ්‍රී වීරපරාක්‍රම නරේන්ද්‍රසිංහ රජු | 13). 2 (අස්වාමික න්‍යාය අනුවය) |
| 4).4 ( හැමිල්ටන් ඇළ) | 14).4 ( එන්ෆිල්ඩ් නම් රයිෆල් භාවිතය ප්‍රතික්ෂේප කිරිම නිසා ඉන්දීය හමුදා භටයන්ට දඬුවම් පැමිණවීම |
| 5).4 (වෙස්ට් රිජ්වේ) | 15).2 (පොන්නම්බලම් රාමනාදන් ) |
| 6).2 ( කෝපි) | 16) .4 ( මැනිං ආණ්ඩු ක්‍රම ප්‍රතිසංස්කරණය) |
| 7). 3 ( මදුරාසි පාලනය) | 17) .3 ( ඩොනමෝර්) |
| 8).1 (ලන්දේසි ) | 18). 1 ( ජාතික රාජ්‍ය සභාව) |
| 9). 4 ( මාතලේ ) | 19).3 (ගල්ඔය සංවර්ධන යෝජනා ක්‍රමය) |
| 10) 2 (හික්කඩුවේ සුමංගල හිමි) | 20 ). 4 (ශ්‍රේෂ්ඨාධිකරණය ) ( 2 X 2 = 40) |

11 කොටස

1). (අ) i F ii A iii G iv E v D vi B ( ල. 6)

(ආ) i ඩී.එස් .සේනානායක) / දොන් ස්ටීවන් සේනානායක මහතා

ii . එක්සත් ජාතික පක්ෂය iii. ගල්ඔය සංවර්ධන යෝජනා ක්‍රමය

(ඇ). i. ශ්‍රී ආරුමුග නාවලර්තුමා / ආරුමුග නාවලර්තුමා

ii. හින්දු ආගම iii.බාල පාඨම් ( ලකුණු 3)

2). i කොළඹ කොමාණ්ඩරිය , ගාළු කොමාන්ඩරිය .යාපනය කොමාණ්ඩරිය ( ල.3)

ii . කුරුඳු , පුවක්, ඇත්දළ , ගම්මිරිස් ,සාදික්කා , එන්සාල් , මී ඉටි. ඇතුන් ( හතරක් නම් කිරීමට ල.4)

iii. *රෝම ශෘහ නිර්මාණය මෙරටට ලැබීම * විවිධ ආහාර වර්ග රාශියක් හඳුන්වා දීම

*. ලන්දේසි උසාවි ක්‍රමය හඳුන්වා දීම * සිංහල දෙමළ භාෂාවලට ලන්දේසි වචන එකතු වීම

* බර්ගර් ජන කොටස එකතු වීම ( කරුණු 2 ක් විස්තර කිරීමට ල. 5)

3). i පොල්ගස් බද්ධ ,ලුණු බද්ධ. මාළු බද්ධ දුම්කොල බද්ධ ( බදු වර්ග තුනක් නම් කිරිමට ල. 3)

ii . A- වෙල්ලස්ස.දුම්බර.හේවා හැට හාරිස්පත්තුව ,මාතලේ , නුවර කලාවිය, පස් කෝරලය , සබරගමුව ( දෙකක් නම් කිරිමට ල.2)

B . ටොරින්ටන් සාමිවරයාගේ නව බදු ප්‍රතිපත්තිය ( ල. 2)

iii. * සහන පිළිබඳ සොයා බැලීමට බෙල් මහතාගේ මූලිකත්වයෙන් කමිටුවක් පත් කිරීම

*. ටොරිස්ටන් ආණ්ඩුකාරවරයා හා යටත් විජිත ලේකම් තනතුරුවලින් පහ කිරීම

*. සමහර බදු සංශෝධනය කිරීම සහ ඇතැම් බදු සම්පූර්ණයෙන්ම ඉවත් කිරිම.

* .දේශිය කෘෂිකර්මාන්තය දියුණු කිරීමටරාජ්‍ය අනුග්‍රහය යොමු විම ( ප්‍රතිඵල දෙකක් විස්තර කිරීමට ( ල.5)

4). i. අධ්‍යාපන මාධ්‍ය යොදා ගැනීම , දේශන මාධ්‍ය යොදා ගැනීම , ලේඛන මාධ්‍ය යොදා ගැනීම ,සමාජ සේවා කටයුතු යොදා ගැනීම ( කරුණු තුනක් සඳහා ල.3)

ii. A . ධම්මාලංකාර හිමි. සුමනතිස්ස හිමි, B . මිගෙට්ටුවත්තේ ගුණානන්ද හිමි , C. හික්කඩුවේ සුමංගල හිමි, D. ඩී.බී.ජයතිලක මහතා (ල.4)

iii. පරමේශ්වර විද්‍යාලය.රාමනාදන් විද්‍යාලය, ( ල.2)

B.* .පුවත්පත් මඟින් ජනතාව දැනුවත් කිරීම ( උදා.මුස්ලිම හෙයිසන් පුවත්පත)

*. පාසල් පිහිටුවීම

*. ඉස්ලාම් ආගමික අධ්‍යාපන ක්‍රමය ඉදිරියට ගෙන යාමට කැප වී කටයුතු කිරීම( ල.3)

5). i. A . ඩබ්.සී.බෙනර්ජි B. මවුන්ට් බැටන් සාමි C. ශ්‍රී ජවහල්ලාල්නේරු ( ල.3)

ii.* බ්‍රිතාන්‍ය පාලනය යටතේ ඉන්දියාව තුල ඇති වූ දේශපාලනික එක්සත් බව

*. යටිතල පහසුකම් දියුණු විම තුලින් එකමුතුකම වර්ධනය වීම

* ඉංග්‍රිසින් ඉන්දියානුවන් පහත්කොට සැලකිම

* බටහිර අධයාපනය ලැබූ ඉන්දියානු උගතුන් විසින් ජනතාව දැනුවත් කිරීම ( කරුණු දෙකකට ල.2)

iii. අවිහිංසාවාදීව සටන් ව්‍යාපාර සඳහා මූලිකත්වය ගන්නා ලද්දේ මහත්මා ගාන්ධි විසිනි

*. චම්පරන් ව්‍යාපාරය *. ඛේඩා ව්‍යාපාරය * සත්‍යාග්‍රහ ව්‍යාපාරය

* දස්ඩි පා ගමන ( තුනක් නම් කිරීමට ල.3 / එකක් විස්තර කිරීමට ල.2)

6). i. A . සී.ඩබ්.ඩබ් . කන්නන්ගර මහතා/ක්‍රිස්ටෝපර් විලියම් විජේකෝන් කන්නන්ගර මහතා

B .සර් ෆෙඩ්රික් නෝත්

C. .සිරිමාවෝ බණ්ඩාර නායක මැතිණිය (ල.3)

ii. යුරෝපීය නායකයන් - විලියම් සිග්මි , ජෝර්ජ් වෝල්

දේශිය නායකයන් - පොන්නම්බලම් රාමනාදන් , පොන්නම්බලම් අරුණාචලම්, සර් ජේම්ස් පීරිස්, එච් .ජී. සී පෙරෙයිරා ( හතර දෙනෙක් නම් කිරීම ට ල.4)

iii.* රාජ්‍ය මන්ත්‍රණ සභාව පිහිටුවීම.*සර්ව ජන ජන්ද බලය ප්‍රදානය කිරීම * විධායක කාරක සභාව පිහිටුවීම

* වාර්ෂික නියෝජනය අහෝසි කිරීම ( දෙකක් නම් කිරීමට ල.2,එකක් විස්තර කිරීමටල.3)

7). i. A -එස්.ඩබ්.ආර්.ඩී. බණ්ඩාරනායක මහතා

B - විලියම් ගොපල්ලව මහතා

C. - ඩඩ්ලි සේනානායක මහතා ( ල.3)

ii. A - අගමැතිවරයා පත් කිරීම ,අමාත්‍ය මණ්ඩලය පත් කිරීම හා විෂය ගොනු පැවරීම, රජයේ උසස් නිලධාරීන් පත් කිරීම , අමාත්‍ය මණ්ඩලයේ ප්‍රධානියා ලෙස කටයුතු කිරීම ( දෙකක් නම් කිරීමට ල.2)

B. පාර්ලිමේන්තුව කැදවීම, වාර අවසාන කිරීම ,විසුරුවා හැරීම , පාර්ලිමේන්තුවේ මංගල රැස්වීමේ මුලසුන ගැනීම .ආණ්ඩුවේ ප්‍රතිපත්ති ප්‍රකාශය ඉදිරිපත් කිරීම (දෙකක් සඳහන් කිරීමට ල.2)

C. 9 ශ්‍රේණිය ඉතිහාස පෙළ පොත 134 වන පිටුව